AL/2026/71/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| සිංහල I | | |
| சிங்களம் I | | 71 S I |
| Sinhala I | | |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

***උපදෙස්:***
* **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන (**අ**), (**ආ**), (**ඉ**), (**ඊ**) හා (**උ**) උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (**ඌ**) හා (**එ**) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(**අ**) 'තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේ ය. ඊට නිසි පිළියම් දන්නා කෙනකුන් ගෙනවුත් පිළියමක් කරව' යි උන්ගේ අදහස් ආහරණය කළ ලෙසින් ම නොහැඟුණා සේ කිවුය. බමුණාණෝ ඒ අසා '**පින්වත් බැමිණි කුමක් කියයි ද? පිළියමට වෙදවරුන් ගෙනා කල වෙදකම් නිමන තෙක් බතුත් දුනමැනව. මංකුලීත් දුනමැනව. කෙළවර මිලත් දුනමැනව.** බලවත් ව තිබෙන ව්‍යාධි හෙයින් මිලත් මඳෙකින් සෑහි නොයෙයි. හීදඬු මිටියකින් හීදණ්ඩක් හයාගත් කලට අඩුව පෙනෙන්නා සේ කවර තරම් වස්තුයෙකත් දවසක් වුවත් ප්‍රයෝජන වුන් කලට අගය අඩු වන්නා සේ සම්පත් අඩු වන නියාව කලන්දක ජාතකයෙහි ලේනාණන් නඟුට වැදගත් පැන් ඉසි පමණකින් මූද පැන් අඩු වූ නියායෙනුත් දතමනා වේ දැ'යි යන්න තමන් නොදත් හෙයින් **දෘෂ්ටාන්ත** කොට නොකීවත් සෙසු ලෙස කථා කීමෙන් තමන් ඉතා ලාමක නියාව හැඟවූහ.

(i) පුත්‍රයාට ප්‍රතිකාර සඳහා වෛද්‍යවරුන් කැඳවූ කල දිය යුතු වන්නේ මොනවා ද?

(ii) බමුණා තම පුතුට බෙහෙත් කරන කල තම වස්තුව වැය වන ස්වරූපය පිළිබඳ ව කියැවෙන උපමාව කුමක් ද?

(iii) 'තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේ ය.' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**දෘෂ්ටාන්ත**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(**ආ**) අභයරාජකුමාරයෝ තමන්ගේ ගෙට ගොස් ජීවකයන් කැඳවා රජ්ජුරුවන් කී පවත් කියා "රජගෙට මා හා කැටිව එව"යි කීහ. එවේලෙහි ජීවකයෝ යහපතැයි ගිවිස ඒ ව්‍යාධියට තරම් ඖෂධයක් භාවිත කොට නිය හස්සේ සඟවාගෙන පියාණන් හා කැටිව රජගෙට ගොස් රජ්ජුරුවන් දුටහ. රජ්ජුරුවෝ ජීවකයන් දැක උන්ගේ දර්ශනයෙහි පැහැද ඔවුන් තනි කොට මතුමාලට ගෙන ගොස් තමන්ගේ ව්‍යාධිය දැක්වූහ. එවේලෙහි ජීවකයෝ ව්‍යාධිය බලා "අද ම සන්හිඳුවාලමි. දිවි පමණින් මතු ඇති විය නොදෙමි. මාගේ **සුරුකම්** බලාවදාළ මැනවැ"යි වාසි කියාලා එම විට ම නියහස්සෙහි තුබූ ඖෂධය මැත් කොට පිළකය මතුයෙහි ආලේප කළහ. එකෙණෙහි ආලේපය හා සමඟ භගන්ධරාබාධය සන්හිඳී පිළකය ඇති වූ තැන කොතෙන බවත් නොදැනෙන සේ අන්තර්ධාන විය.

(i) රජතුමාට ප්‍රතිකාර කිරීම සඳහා ජීවක වෛද්‍යවරයාගේ පූර්ව සූදානම කෙබඳු ද?

(ii) රජතුමා, තමාගේ ව්‍යාධිය ජීවකට දැක්වූයේ කවර ස්ථානයක දී ද?

(iii) 'උන්ගේ දර්ශනයෙහි පැහැද' යන්න ලිහිල් බසින් ලියන්න.

(iv) '**සුරුකම්**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



(ඉ) “මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි. මා මළ කල්හි මාගේ **වියෝග ශෝකයෙන්** හඬා පෙර මා හා සමඟ එක් ව කෙළ ඇවිද ලියමඬුලු වන ලැහැප් අතල ගල් ගං හිස් ගිරිමුදුන් රුක් යට වැලිතලාදී වූ ඒ ඒ තැන්හි අඬා ඇවිදිනා තීගේ අදෝනා කම් අපේක්ෂා කරන්නා වූ මම හඬන්නෙමි” යනාදීන් මෙසේ ඒ මහ බෝසත් අඬා මල් ඇතිරිය මත්තේ ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේය. රජ ද විදි තැන ම සිටියේය. චන්ද්‍රිකා නම් කින්නරාඞ්ගනා තොම මහ බෝසත්හු මෙලෙස හඬතත් තමාගේ කෙළියෙහි ඇලී මත් වන ලද්දී බෝසත්හු චිත් කෑ නියාවත් නොදන්නීය. එතකුදු උවත් මහ බෝසත්හු විසංඥ ව වැදහොත් නියාව දැක “ඇයි මාගේ ස්වාමි පුරුෂයාණන් මී නියාවූ මගේ නැටුම් නොබලා වැදහෝනට කවර දුකෙක් උපන් දැ”යි පරීක්ෂා කොට බලන්නාහු ප්‍රහාර මුඛයෙන් වෑහෙන්නා වූ ලේ දැක ප්‍රිය වූ ස්වාමි පුත්‍රයා කෙරෙහි සෝකය දරා ගත නොහී ආක්‍රෝශ බෙණෙමින් මහ හඬින් හඬන්ට වන්හ.

(i) මහ බෝසතුන් ශෝකයට පත් වූයේ කුමක් නිසා ද?

(ii) බෝසතුන් සිහිසුන් ව මල් ඇතිරියෙහි වැතිරී සිටි වග කිඳුරියට නොදැනුණේ මන්ද?

(iii) “මී නියාවූ මගේ නැටුම් නොබලා වැදහෝනට කවර දුකෙක් උපන්දැ’යි” මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

(iv) ‘**වියෝග ශෝකයෙන්**’ යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඊ) එකල්හි ස්වර්ණතිලකාවගේ පියා ද යහපතැයි ගිවිස විසිතුරු වූ කර්මාන්ත ඇති දහසක් වටනා පලසකින් දුවගේ ශරීරය වසා පොරවා තමා ගායනා කරන වීණාදි වූ තූර්යභාණ්ඩ ගෙන්වා ගෙන ස්වර්ණතිලකාවන් හා සමඟ මග බැස නික්මිණි. මෙසේ නික්මුණාවූ ඒ චණ්ඩාල බ්‍රාහ්මණතෙම අතරමඟ එක් නුවරෙක රජ්ජුරු කෙනකුන් දැක වීණා ගායනා කරනුයේ ස්වර්ණතිලකාව තමා පිටිපස හිඳිනා සේ සලස්වා තෙමේ වීණා ගායනා කරන්ට පටන් ගත. එකල්හි ඔහු පිටිපස හුන්නාවූ ස්වර්ණතිලකා තොමෝ නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රීලීලාවෙන් යුක්ත ව මදලස බැල්මෙකින් රජහු මුහුණ බලා තමා පෙරව හුන් පලස මඳක් පහකොට **ශරීරප්‍රභා** දක්වාලුව. රජ්ජුරුවෝ ඇගේ ශරීරාලොක හා රූපසම්පත්තිය දැක කාමයෙන් විසංඥ ව සිහි මුළා ව මඳ ඇසිල්ලකින් ලබනලද ආස්වාද ඇති ව...

(i) ස්වර්ණතිලකාගේ ශරීරය වසා පොරවා තිබුණේ කුමකින් ද?

(ii) චණ්ඩාල බ්‍රාහ්මණයාණන් ස්වර්ණතිලකා සමඟ යන විට රැගෙන ගියේ මොනවා ද?

(iii) ‘නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා’ මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) ‘**ශරීරප්‍රභා**’ යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(උ) ලෙස උදය දිවයු රෑ  
දුරුකර ඇඳුරු දුක’ඳු රෑ  
පොබයා මුව තඹු රෑ  
මෙසේ පැවසී තෙපුල් **පුරඳු** **රෑ**

ගුත්තිල ඇඳුරු ස ඳ  
ඔහු වාදයට වන් ස ඳ  
වයව තත් සිඳ සි ඳ  
නැඟෙයි නද සිඳි තතින් මනන ද

(i) ගුත්තිල ඇඳුරුතුමාගේ වීණා නාදය මනහර වූයේ කුමන හේතුවක් නිසා ද?

(ii) පළමු වන පද්‍යයෙහි ඇති රූපකාලංකාරයක් උපුටා දක්වන්න.

(iii) ‘ගුත්තිල ඇඳුරු ස ඳ  
ඔහු වාදයට වන් ස ඳ’ මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ‘**පුරඳුරු**’ යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

● (**ඉ**) සහ (**ඊ**) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(**ඉ**) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "බමුණ, හඳුනන මඟ යමින් සිට මං විචාරන්නා සේ මා අතින් කුමක් නිසා විචාරයි ද?"

(ii) "අප පන් සියය වෙහෙසයි දැ?"

(iii) "තොප කීයේ කාරණා මය. ඥානවන්තයන් සිතුවමනා සිතුවිල්ලෙක් මය."

(iv) "අපගේ ආචාරීන් වහන්සේ දක්නා කැමැත්තම්හ."

(v) "උඹට සාක්කියට කවුරුත් ඉන්නවා ද?"

(vi) "මා කෙරේ සෙනේ ඇති
කෙනෙක් නැත මුළු ලොවේ
පාලු කතරකි මා හද,
නැත එහි සෙවනක්..."

(vii) "කොහෙදෑ මේ මහමද්දහනේ යන්නේ? ඔළුවට අමුඩ ලේන්සුව වත් දාගන්නේ නැතුව"

(ලකුණු 03 × 4 = 12 යි.)

(**ඊ**) පහත සඳහන් පද්‍ය පන්තියේ භාෂා භාවිතය සහ වස්තු විෂය පිළිබඳ අවධානය යොමු කරමින් රසාස්වාදය කරන්න.

සිරිපා සීතල නොවේ මේ
දැවටෙන්නේ සේද සළුවක් සේ
සතුටු සිතුවිල්ලක් මිස
සිත පුරා

අලුත් ලෙයක් නහර වැල් දිගේ ගලයි
අලුත් මල් පිපී තිබේ නම් නොදත්
අලුත් ලයකි සැදැහැවතුන්ගේ කරුණා හඬෙහි
සැහැල්ලු ය සිරුර, නැත විඩාවක්

නිමිත්තක් නැති සතුටකි

පහළට කරුණා කරමින්
සිත තුළ ද සැරි සරමි
නිමිත්ත සොයා මේ සතුටු හැඟුමේ

අමතක වූ වචනයක් මෙන්
දිව අග ඇති
දනිමි එහෙත් නොදනිමි මේ සතුට

කොයිබ සිට ආවෙ ද
කොයි වෙසින් ආවෙ ද මේ සතුට

යම්තමින් නමුත් ඇසෙනා
සාණ්ටාර හඬ මළුවේ
සිත රැගෙන ගියා ආපහු
අමතක අඳුරු වලා බිඳිමින්

ඉර සේවය බලනා
දුම්බර සිට ආ නඩයක් මැද හිඳ
සිනා සුණා දැරියක්
හිරිමල් සිනා පා

(ලකුණු 12 යි.)

PAST PAPERS WIKI

Past Papers Wiki



**2.** 'ධර්මසේන හිමියන්ගේ අභිප්‍රාය ශ්‍රද්ධා බුද්ධි සම්පන්න සමාජයක් බිහි කිරීම ය.' සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**නැත හොත්**

ස්වකීය අරමුණු ඉෂ්ට කර ගැනීමෙහි ලා ඒ ඒ චරිත අවස්ථෝචිත ව ක්‍රියාත්මක වන ආකාරය සියුම් ව ප්‍රතිනිර්මාණය කිරීමට ජාතක කථා කර්තෘවරුන් දැක්වූ කුසලතාව නියමිත කථා ඇසුරින් විමසන්න.

(ලකුණු 15 යි.)

**3.** මේ ප්‍රශ්නයෙහි **'අ'** කොටසට ද **'ආ'** සහ **'ඇ'** කොටස් දෙකෙන් **එක්** කොටසකට ද පිළිතුරු සපයන්න.

**(අ)** "පද්‍යකරණයෙහි ලා නව ප්‍රවේශයකට යොමු වීම ගම්පොළ සාහිත්‍ය අවධියේ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි." විමසන්න. (ලකුණු 07 යි.)

**(ආ)** සිංහල බණකථා සාහිත්‍යය ශ්‍රාවක-පාඨක ජනයා අතර වඩාත් ජනප්‍රිය කරවීමට පූජාවලී කතුවරයාගෙන් සැපයුණු දායකත්වය නියමිත කථා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

**(ඇ)** කාමයෙන් මුළා වීම පුද්ගල පරිහානියට හේතු වන ආකාරය සද්ධර්මාලංකාරයේ නියමිත කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි.)

**4.** ශබ්දයේ හා අර්ථයේ සුසංයෝගය ගුත්තිල කාව්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය විමසන්න.

(ලකුණු 15 යි.)

**5.** කාලීන සමාජ යථාර්ථය නිරූපණයෙහි ලා බැද්දේගම කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය අගයන්න. (ලකුණු 15 යි.)

**6.** මාපිය සෙනෙහසේ අපූර්වත්වය නිරූපණය කෙරෙන විශිෂ්ට නිර්මාණයක් ලෙස සයිමන් නවගත්තේගමගේ ස්නේහය කෙටිකතාව විචාරයට ලක්කරන්න. (ලකුණු 15 යි.)

**7.** කවියේ ආකෘතිය සහ රසෝත්පත්තිය අතර පවත්නා සහසම්බන්ධතාව නිදහස් කවියේ ප්‍රථම තරංගයට/අවධියට අයත් කවීන්ගේ නිර්දිෂ්ට පද්‍ය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**8.** 'අනපේක්ෂිත සිද්ධි දාමයක ප්‍රතිඵල ලෙසින් පෙමතො ජායතී සොකො නාට්‍යය ඛේදාන්තයක් බවට පත් වේ.' විමසන්න. (ලකුණු 15 යි.)

***

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ............................

**උපදෙස්:**

* **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 **'සාධන'** යන්නෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අයත් වනුයේ කුමන අක්ෂර ගණයට ද?
(1) කණ්ඨජ (2) දන්තජ (3) ඕෂ්ඨජ
(4) තාලුජ (5) මූර්ධජ (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) කෙලවර, අළුගෝසුවා, තිප්පොළ, පැමිණිල්ල, කළුළිය
(2) කෙළවර, අලුගෝසුවා, තිප්පොල, පැමිණිල්ල, කලුළිය
(3) කෙලවර, අළුගෝසුවා, තිප්පොළ, පැමිනිල්ල, කළුළිය
(4) කෙළවර, අලුගෝසුවා, තිප්පොල, පැමිණිල්ල, කලුළිය
(5) කෙළවර, අලුගෝසුවා, තිප්පොළ, පැමිණිල්ල, කලුළිය (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) පිදුරුතලාගල, කිරිගල්පොත්ත, ශ්‍රී පාදය, හුන්නස්ගිරිය
(2) ශ්‍රී පාදය, හුන්නස්ගිරිය, කිරිගල්පොත්ත, පිදුරුතලාගල
(3) කිරිගල්පොත්ත, පිදුරුතලාගල, ශ්‍රී පාදය, හුන්නස්ගිරිය
(4) කිරිගල්පොත්ත, ශ්‍රී පාදය, පිදුරුතලාගල, හුන්නස්ගිරිය
(5) හුන්නස්ගිරිය, ශ්‍රී පාදය, කිරිගල්පොත්ත, පිදුරුතලාගල (......)

1.4 මෙහි ඇති **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) අ/ආ + ඉ/ඊ = 'ඒ' ය.
(2) අ/ආ + ඕ = 'ඖ' ය.
(3) අ/ආ + උ/ඌ = 'ඕ' ය.
(4) අ/ආ + ඒ = 'ඓ' ය.
(5) අ/ආ + ඓ = 'ඒ' ය. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) තහනම් උත්තේජක, වාචික පරීක්ෂණය, සොඳුරු ආඟ්ලාදායකයා, ප්‍රභූ ආරක්ෂාව
(2) කාන්තා හිංසනය, බරපතළ අපරාධ, වෙසක් මංගල්‍යය, තාක්ෂණික මෙවලම්
(3) නවකථා විචාරය, ගම් පියස, ව්‍යවසාය සංවර්ධනය, පෞරාණික සිතුවම්
(4) අද්‍යතන ප්‍රවණතා, ළමා අපයෝජන, ආපදා කළමනාකරණය, දේව භාෂිත
(5) මනුෂ්‍ය ඝාතන, සංවේදී ප්‍රශ්න, නිවැරදි මග, දේශගුණික විපර්යාස (......)

[දෙවැනි පිටුව බලන්න.

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) අංග, භංග, වංක, රඟ (2) ශර, නර, හැර, සුර
(3) ප්‍රබුද්ධ, ප්‍රසිද්ධ, ප්‍රබන්ධ, ප්‍රමෝද (4) ආකර, ආදර, ආහාර, ඇවර
(5) දාස, දාම, කෑම, නාම (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සඳ, අඳ, වඳ, කඳ (2) වත, ගත, ශත, අත
(3) පාත්තර, සිත්තර, අන්තර, මන්තර (4) නැණ, අණ, ධන, පණ
(5) සාර, වාර, බාර, පාර (......)

1.8 'විශේෂණ පූර්ව පද, උපමාන අපර පද, විශේෂණ අපර පද' හා 'උපමාන පූර්ව පද' යන සමාස පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) සිසිල්බිම, තිසරතන, හදවිමන, පැරකුම්නිරිඳු
(2) පැරකුම්නිරිඳු, හදවිමන, තිසරතන, සිසිල්බිම
(3) හදවිමන, පැරකුම්නිරිඳු, සිසිල්බිම, තිසරතන
(4) සිසිල්බිම, හදවිමන, පැරකුම්නිරිඳු, තිසරතන
(5) තිසරතන, සිසිල්බිම, හදවිමන, පැරකුම්නිරිඳු (......)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ඇතිරූ, පිපිරූ, වැපිරූ, මැතිරූ (2) සිඟන, අඟන, රඟන, නඟන
(3) දැල්ලීම්, ඇල්ලීම්, සෙල්ලීම්, ඉල්ලීම් (4) මරණීය, පූජනීය, නින්දනීය, කරණීය
(5) රැඳිලි, වැඳිලි, බැඳිලි, ඇඳිලි (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**කෙළිමින්** තැන තැන ල න්දූ"
(ආ) "මිල **දී** සතුටුකො ට"
(ඉ) "**කියව** පුළුවන්ද වෙණ වැයු මා "
(ඊ) "**කරත** වෙණ ගායනා ස රියේ"

(1) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා,
(3) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා
(4) විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා (......)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පින්වත්, ගුණවත්, සාරවත්, සිල්වත්
(2) ආර්ථික, නාගරික, දාර්ශනික, වාර්ෂික
(3) බුද්ධිමත්, කීර්තිමත්, භක්තිමත්, අසිරිමත්
(4) වජ්‍රමය, රජතමය, අයෝමය, ප්‍රණාමය
(5) මාධුර්ය, චාතුර්ය, තාරුණ්‍ය, ලාලිත්‍ය (......)

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත වරණය තෝරන්න.

(1) ප්‍රලාප, ප්‍රවාද, ප්‍රකෝප, ප්‍රමෝද (2) දුර්වල, දුර්ජන, දුර්ලභ, දුර්මුඛ
(3) අනුවාද, අනුරාග, අනුරූප, අනුලෝම (4) ප්‍රතිචාර, ප්‍රතිලාභ, ප්‍රතිරාව, ප්‍රතිරූප
(5) සුමට, සුසර, සුතුර, සුගුණ (......)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) උඩ, යට, සිට, හෙට
(2) නිතර, විතර, අතර, කතර
(3) ඒ, මේ, සේ, හෝ
(4) ඉතින්, විසින්, බැවින්, හෙයින්
(5) එලෙස, මෙලෙස, එතෙක්, මෙතෙක් (......)

1.14 "පරාර්ථකාමී පසඤ්ඤකර හිමිගේ **ලංකාගමනය සුවිශේෂ ශාසනික** සන්ධිස්ථානයකි." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) උපසර්ග, සන්ධි, තද්ධිත (2) තද්ධිත, සන්ධි, උපසර්ග
(3) සන්ධි, තද්ධිත, උපසර්ග (4) උපසර්ග, තද්ධිත, සන්ධි
(5) සන්ධි, උපසර්ග, තද්ධිත (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය **නොකෙරෙන** ක්‍රියාරූපයක් සහිත වරණය තෝරන්න.
(1) කරවයි, මරවයි, උරවයි, ඔරවයි
(2) අසව, බලව, කියව, සිතව
(3) සැලේවා, ඇලේවා, දිලේවා, බැලේවා
(4) කා, බී, දී, ගා
(5) දකිත, රකිත, ලියත, නසත (......)

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) කුණුරස, රළුබිම, පටුපාර, උණුවතුර
(2) දුගඳ, දුබල, අබල, කබල
(3) අටවක, නවගුණ, සත්සති, තුන්වරු
(4) දේවපූජා, දේවශාප, දේවලෝක, දේවදූත
(5) ගස්වැල්, අත්පා, රැදවල්, කැමබීම (......)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද **පමණක්** ඇතුළත් වරණය තෝරන්න.
(1) ලෝකාපවාද, ලෝකෝත්තර, ලෝකෝපකාර, ලෝකාර්ථ
(2) කවීන්ද්‍ර, මුනීන්ද්‍ර, මහේන්ද්‍ර, දේවේන්ද්‍ර
(3) ඇත, මැත, දැත, දැළ
(4) කම්මල, කම්මුල, අස්සන, වප්පිහිය
(5) වෙදැදුරු, මිණිබරණ, එදිනෙදා, දකුණත (......)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) දසපද, දසදෙස, දසසිල්, දසපනත
(2) ගැයුම්, නැටුම්, පැතුම්, සිතුම්
(3) යමින්, එමින්, නමින්, දෙමින්
(4) අත්තම්, වත්තම්, ගෙත්තම්, සිත්තම්
(5) නිරිඳාණ, සමිඳාණ, කුමරාණ, මිතුරාණ (......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) "මම එය එදින ම නිවැරදි කළෙමි"යි නිවේදකයා කීවේ ය.
(2) ගංවතුර ආපදා කාලයේත් සංචාරකයන් බදුල්ලට ගියෝ ලු.
(3) සූර්ය තෙමේ සෞම්‍ය රශ්මිය පතුරුවන්නට වූහ.
(4) යකැදුරා ආතුරයින් ලවා පහන් දල්වති.
(5) මිතුරා හා මිතුරිය හා මම පාඩම් කරති. (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය තෝරන්න.
(1) ඒ නාට්‍යයේ චරිත නිරූපණය හරියට ම සිදු වී තිබෙනවා.
(2) මා ගිය ගමනේ අහුමුලු සෙවීම ඔබේ වැඩක් නො වේ.
(3) කනින් කොනින් ඇහෙන දේවල් ඇත්ත කියා හිතනු එපා.
(4) මහින්දාගමනය ඓතිහාසික වැදගත්කම් රැසකින් සමන්විත වේ.
(5) ඒක නිසා ළමයි ගැන හැමදෙනා ම වැඩිවැඩියෙන් සැලකිලිමත්. (......)

(ලකුණු 20 යි.)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පිරිවෙන් සම්බන්ධයෙන් ලැබී ඇති සියලු ම සාක්ෂ්‍ය අතුරෙන් පැපිලියාන ශිලා ලේඛනය පමණ විශ්වාස කළ හැකි හා නිවැරැදි බවට සහතික කළ හැකි අන් එක ද ලේඛනයක් නොමැත. එම ශිලා ලේඛනය වූ කලී රජු ප්‍රමුඛ රාජ සභාව විසින් එම ස්ථානයෙහි විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා නිකුත් කරන ලද විශ්වවිද්‍යාලය අධිකාර පත්‍රයකි. වර්තමාන ව්‍යවහාරය අනුව අපට එය පැපිලියාන පිරිවෙන් ආඥා පනත නැතහොත් පැපිලියාන පිරිවෙන් පනත යනුවෙන් හැඳින්විය හැකි ය. රජු හා රජුගේ උපදේශකයන් සවිස්තර කරුණු පිළිබඳ ව කෙතරම් අවධානයක් දැක් වූයේ ද, එසේ ම කෙතරම් විමසිලිමත් වූයේ ද යන්න එමගින් පැහැදිලි වෙයි. තව ද ලක්ෂ සංඛ්‍යාත පරිත්‍යාග මුදල් කැප කළ එහි සංවිධානය කෙතරම් සංකීර්ණ ද යන බවත් එයින් අවබෝධ වෙයි. මෙම අධිකාර පත්‍රය කිසි දිනක විදේශීය භූමියක අධ්‍යාපන ආයතනයක් අනුව සකස් නො වූ අපේ පිරිවෙන්වල පාරම්පරික සංස්ථාපනය ආදර්ශ කොට දැක්වී ය.

මුදලින් රන් කාසි 25,000ක් වැය කොට පුස්තකාලයක්, නේවාසිකාගාරයක් සහ වෙනත් බොහෝ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා රජු විසින් භාණ්ඩාගාරය භාර නිලධරයාට උපදෙස් දෙන ලද බව පැපිලියාන ශිලා ලේඛනයේ කියැවේ. රජු ඉතා අගනා ඉඩම් සහ වෙනත් දේපළ විශ්වවිද්‍යාලයට පවරා තැබූ අතර ඒවායින් ලැබෙන ආදායම විශ්වවිද්‍යාලයේ නිත්‍ය නඩත්තුව සඳහා ගත යුතු යයි දළ උපදෙස් නිකුත් කොට තිබිණි. මෙම රාජකීය පරිත්‍යාගය අනුව නා නා මාදිලියේ වියදම් සඳහා අවශ්‍ය මුදල් හිඟයක් නො වී ය. ප්‍රධානාචාර්යවරයා, ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ කාර්ය මණ්ඩලය සහ සුළු සේවකයන් ඇතුළු වෙනත් කාර්ය මණ්ඩල සඳහා ප්‍රමාණවත් මුදල්හදල් වෙන් කොට තිබිණි. ග්‍රන්ථ රචකයන් සඳහා ද වේතන වෙන් කර තිබේ. ත්‍රිපිටකය, තර්ක ශාස්ත්‍රය සහ භාෂා යන විෂයයන් පිළිබඳ අධ්‍යයනයට මුල් තැන දී තිබිණි. මෙම විෂයයන්හෙන් ප්‍රවීණ, යම් පුද්ගලයන් පැමිණිය හොත් නියමිත සම්මාන මුදලක් ගෙවා ඔවුන් ඉගැන්වීමෙහි යෙදවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතු ය.

VI පැරකුම්බා රජුගේ මහා ව්‍යාපාරයක් වූ පැපිලියානේ සුනේත්‍රා මහා දේවී පිරිවෙන පෘතුගීසීන් විනාශ කරන තුරු දිගු කලක් ම දියුණු ව පැවතියේ ය. එහි පිරිහීමෙන් පසු ව පවා ඒ ආශ්‍රිත චාරිත්‍ර-වාරිත්‍ර සහ සම්ප්‍රදාය, පිරිවෙනට අනුබද්ධ ව පැවති ආරාමයන්හි සහ දේවාලයන්හි කලක් ගත වන තුරු නොකඩවා පැවතිණි. රත්නපුරයේ සමන් දේවාලය ශිලා ලේඛනයෙහි ප්‍රකාශ කොට ඇති පරිදි දේවාලයෙහි පිරිත් සජ්ඣායනා කිරීමත්, වෙනත් බෞද්ධ ආගමික පිළිවෙත් හා චාරිත්‍ර විධි පැවැත්වීමත් රජු පැපිලියානේ පිරිවෙනට පවරා තිබීම නිදසුනක් වශයෙන් දැක්විය හැකි ය. මෙම පුරුද්ද පෘතුගීසි ආක්‍රමණ හේතු කොට ගෙන අතපසු වන තෙක් නොකඩවා පැවතුණේ ය. මෙම දේවාලයෙහි දක්නට ලැබෙන පෘතුගීසි ශිලා ලේඛනයත් සමග ගලෙහි කැටයම් කොට ඇති පෘතුගීසි සොල්දාදුවකු සිංහල ප්‍රතිමල්ලවයකුට පහර දීමේ දර්ශනය පෘතුගීසි ආක්‍රමණ හා සම්බන්ධ දාමරික කටයුතු පිළිබඳ සාක්ෂ්‍ය දරයි.

(i) වර්තමාන ව්‍යවහාරය අනුව පැපිලියාන ශිලා ලේඛනය හැඳින්විය හැකි වන්නේ කවර නම්වලින් ද?

(ii) රජු ප්‍රමුඛ රාජ සභාව විසින් විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා නිකුත් කෙරුණු අධිකාර පත්‍රය මගින් ආදර්ශ කොට දක්වා ඇත්තේ කුමක් ද?

(iii) පෘතුගීසි ශිලා ලේඛනය දක්නට ඇත්තේ කවර ස්ථානයක ද?

(iv) පැපිලියාන විශ්වවිද්‍යාලයේ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් රජුගෙන් ඉටු වූ කාර්යභාරය කුමක් ද?

(v) මේ පිරිවෙන පිරිහීමෙන් පසු ව ද එහි කටයුතු නොකඩවා පවත්වාගෙන ගිය බවට දැක්වෙන නිදර්ශනය කුමක් ද?

(vi) නියමිත සම්මාන මුදලක් ගෙවා ප්‍රවීණයන් ලවා ඉගැන්වූවා වූ විෂයයන් මොනවා ද?

(ලකුණු 02 × 6 =12 යි.)

[පස්වැනි පිටුව බලන්න.

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අවසානයේ වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

නූතන මිනිසා තමාට ඇවැසි ලෙස නො ව ජනමාධ්‍ය විසින් සකස් කර දෙනු ලබන ආකාරයට දෛනික චර්යා හැඩගස්වා ගනී. ජනමාධ්‍ය විසින් තෝරා දෙනු ලබන ආහාර ම භුක්ති විඳියි. එය කෙතරම් ප්‍රතිවිපාක ඇති කරන කරුණක් ද කිවහොත් ක්ෂණික ආහාරවලින් යැපෙන, විවිධ රෝගාබාධ සමඟ ජීවත්වන්නන් පිරිසක් බිහි වී ඇත. අධික රුධිර පීඩනය, දියවැඩියාව, හෘදයාබාධ ආදි රෝගයන්ගෙන් තොර වූවෙකු නුදුරු අනාගතයේ දී සොයා ගැනීම උගහට වනු ඇත. වර්ෂයේ කාර්තුවක් කාර්තුවක් පාසා උත්සව හා සැමරුම් අවස්ථා තීරණය කරන්නේ ද ජනමාධ්‍යයන් ය. සැමරුම් ත්‍යාගය කුමක් වුව ද එය තෝරා දෙනු ලබන්නේ ද ජනමාධ්‍ය විසිනි. මවුවරුන්ගේ දිනය, ආදරවන්තයන්ගේ දිනය ආදි වශයෙන් අතිශයින් සංවේදී හා හුදෙක් දිනයක් වෙන්කර සැමරිය නොහැකි පුළුල් මානුෂීය කරුණු, ලාභ අපේක්ෂාවෙන් ජනප්‍රිය සංස්කෘතියේ අංග බවට පත් කර ඇත.

ජනමාධ්‍ය, වෙළඳ දැන්වීම් මත යැපීමට ක්‍රියාකිරීම නිසා වෙළඳ ආයතනවලට අවශ්‍ය ඕනෑ ම වෙළඳ දැන්වීමක් ප්‍රචාරය කිරීමට ඉඩ වෙන්කර ඇත. මේවා මගින් ජනප්‍රිය සංස්කෘතියේ අංග බලහත්කාරයෙන් ම ග්‍රාහකයාට ඇතුළු කිරීමට ක්‍රියාකිරීම දැකගත හැකි ය. දැන්වීම්කරණය පාරිභෝගික චර්යා නිර්මාණය කරන අතර ග්‍රාහකයා කැමති දේ නො ව මාධ්‍ය මගින් පෙන්වන දේ තෝරා ගැනීමට සිදුවන බව ද විශාල සමාගම් වෙළඳපොළේ ඉල්ලුම හා සැපයුම පාලනය කරන්නට මාධ්‍ය අවකාශය භාවිත කරන බව ද ප්‍රබුද්ධ ග්‍රාහකයෙකුට අවබෝධ කර ගත හැකි ය. සරල ව දැන්වීම්කරණය ග්‍රාහකයා තුළ ව්‍යාජ අවශ්‍යතා ගොඩනංවන බව නොරහසකි. අවසානයේ ග්‍රාහකයාගේ බහුභාණ්ඩවාදී ජීවන අපේක්ෂා හා අනවශ්‍ය වියදම් රටා ගොඩනගා පුද්ගල චර්යා වෙනස් කිරීමට තරම් බලාධිකාරයක් ජනමාධ්‍ය ගොඩනඟාගෙන ඇත. සැබෑ ජීවිත අපේක්ෂා වෙනුවට ව්‍යාජත්වය ද අතිශයෝක්තිය ද විකෘති චර්යා ද ගොඩනංවා ග්‍රාහකයා අතරමං කිරීම බහුල ව සිදු වේ.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ස්වාභාවික විපත්තිවලින් වැළකීම සඳහා වනසංරක්ෂණය මගින් සැපයෙන පිටුබලය

(ii) මෙරට වේදිකා නාට්‍ය කලාව ප්‍රවර්ධනය කිරීමට රාජ්‍යානුග්‍රහය ලබා දීමේ වැදගත්කම

(iii) උත්සව සමයකට පමණක් සීමා නොවිය යුතු ලංකාවේ සාම්ප්‍රදායික ජනක්‍රීඩා

(iv) පාඨශාලා ශිෂ්‍යයන් මත්ද්‍රව්‍ය උවදුරෙන් මුදවා ගැනීම සඳහා අනුගමනය කළ යුතු උපාය මාර්ග

(v) ළමා අයිතීන් සුරැකීමට ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ශක්තිමත් සංවිධානයක අවශ්‍යතාව

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් පමණක් නිදොස් කොට ලියන්න. නිදොස් නම් එම වාක්‍ය නැවත ලියන්න.

(i) දේශයට හිතැත්තන් පරසතුරන්ගෙන් රට ආරක්ෂා කරති.

(ii) පෞද්ගලික වෙළෙන්දන් අඩු මුදලට වී මිලදී ගනිද්දී ගොවියෝ අසරණව බලා සිටිති.

(iii) දරුවකු හෝ දැරියක් එම උත්සවයේ දී තෑගි ලබන්නී ය.

(iv) රාක්කය මත තිබුණු පොත් පෙළ පෙරළී බිම ඇද වැටුණේ ය.

(v) යාචකයෙක් සේ වෙස්වළා ගත් ඔහු තම මවගෙන් ද සිඟා කෑවේ ය.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) සංචාරකයෝ ලංකාවෙහි පැරණි පුදබිම් නරඹති.

(ii) නිවේදකයා විදේශීය තානාපතිවරුන් සභාවට හඳුන්වා දෙයි.

(iii) සෙන්පතියා අතිශය තීරණාත්මක අවස්ථාවෙහි චරපුරුෂ සේවාව සඳහා තා පිටත් කළේ ය.

(iv) නඩේගුරා අලංකාරවත් බස් රියෙන් අප යාපනයට රැගෙන ගියේ ය.

(v) ඇමතිවරයා රාජ්‍ය නිලධාරීන් ලවා ග්‍රාමීය සංවර්ධන කටයුතු කරවයි.

Past Papers Wiki



(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (අප/අපි) ශිල්ප නො දනිති'යි (සමහරු/සමහරුන්) සිතූහ.

(ii) ඇමරිකානු (ජනාධිපතිතුමන්/ජනාධිපතිතුමෝ) මැදපෙරදිග යුද්ධයෙන් ජය (ගනිව්/ගනියි.)

(iii) ලේකම්තුමා (නොහොත්/හෙවත්) ලේකම්තුමිය විදේශ සංචාරයට එක් (වන්නේ ය/වන්නී ය.)

(iv) ප්‍රකට කෙටිකතා (කරුවකු/කරුවෙක්) වන ජී. බී. සේනානායක දක්ෂ නවකතා (කරුවෙක්/කරුවකු) ද වෙයි.

(v) බොහෝ (ධනවන්තයෝ/ධනවන්තයන්) (ප්‍රඥාවන්තයෝ/ප්‍රඥාවන්තයන්) නො වෙති.

(ලකුණු 05 × 3 =15 යි.)

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) සරාකල නබෝගැබ අරා හිඳි ඒ **සුදිලි සරාසඳ අවරගිරගින්** බැස ගියේ.
(**සුදිලි** - උපසර්ග, **සරාසඳ** - සමාස, **අවරගිරගින්** - සන්ධි)

(ii) වසරේ **විශිෂ්ටතම නවකතාව** සඳහා **පිරිනැමෙන** සම්මානය ඔහුට හිමි විය.
(**විශිෂ්ටතම** - තද්ධිත, **නවකතාව** - සමාස, **පිරිනැමෙන** - කෘදන්ත)

(iii) **බෝධිසත්ත්වයන් මෙන්** පෙනී සිටින සමහරු සැබෑ ලෙස ම **වංචනිකයෝ** වෙති.
(**බෝධිසත්ත්වයන්** - විභක්ති, **මෙන්** - නිපාත, **වංචනිකයෝ** - විභක්ති)

(iv) සුනිල් **දෙනුවන්**, ඉහිල් **වරලස්**, ළදලු දෙතොල් ඇති ඒ වරගන **දෙවගනක** බඳු ය.
(**දෙනුවන්** - සමාස, **වරලස්** - තද්ධිත, **දෙවගනක** - සන්ධි)

(v) මිගිඳු කෙසුරු **විහිදා** නැඟී සිට ගර්ජනා **කරමින් ගුහාවෙන්** නික්මුණේ ය.
(**විහිදා** - ක්‍රියා, **කරමින්** - ක්‍රියා, **ගුහාවෙන්** - විභක්ති)

(ලකුණු 03 × 5 =15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) වර්තමාන ධර්ම-ශාස්ත්‍රීය ප්‍රබෝධයේ ........................ පහන් දැල්වූවෝ සරණංකර සංඝරාජ මාහිමියෝ ය.

(ii) ශ්‍රී ලාංකික කිතුනු ........................ මඩු දෙවොල වන්දනා කිරීමට අතිශය රුචිකත්වයක් දක්වති.

(iii) කුමාරතුංග මුනිදාස වනාහි මෙරට භාෂා-සාහිත්‍ය ක්ෂේත්‍රය ප්‍රභාවත් කොට නිවී ගිය........................ ප්‍රදීපයකි.

(iv) සිසිල් මඳ ........................ පරිසරයෙහි ඇති සුවදායක බව කියා පායි.

(v) උග්‍ර දේව ........................ ශරීරයට අධික ව වේදනා දෙමින් කතරගම දෙවියන් උදෙසා පූජා පවත්වති.

(vi) වේගයෙන් හමා යන චණ්ඩ........................ නිසා දේපළ මෙන් ම ජීවිත හානි ද සිදු විය.

(බැතිමත්හු, සුළඟ, ඥාන, භක්තිකයෝ, මාරුතය, නැණ)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

'ඒ මිනිහ ළිඳ ගාව පැයක් විතර ඉඳල ආපහු ආව'

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **වනාන්තරයේ** රජා සිංහයා වුවත් වනයේ සද්දන්තයා **අලියා** ය.

(ii) **කුඩුවෙන්** බිමට වැටුණු ලේන් පැටවා **බළලකුගේ** ගොදුර බවට පත් විය.

(iii) වර්තමාන **අධ්‍යාපනයෙන්**, **දරුවන්** දැනුමෙන් සම්පූර්ණ වුව ද ගුණයෙන් වැඩෙනුයේ අල්ප වශයෙනි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

[හත්වැනි පිටුව බලන්න.

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

"පින්වත් පුත්‍රය මාගේ අභාවයෙන් පසු, නුඹ මේ රාජ්‍යය භාර ගන්නෙහි ද "අහෝ පියාණනි ඔබ මේ පවසන්නේ මොනවා ද"

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රය මුළුමනින් ම බද්දෙන් නිදහස් කරමි" යි ජනාධිපතිතුමා පැවසී ය.

(ii) "අපි අපගේ වගකීම නිසියාකාර ව ඉටු කරමු"යි හමුදා නායකයෝ කීහ.

(iii) "සොරු උපක්‍රමශීලී ව පැන ගියහ"යි පොලිස් නිලධාරීහු පැවසූහ.

(ලකුණු $01 \times 3 = 03$ යි.)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහලයේ අවසාන **රාජේන්ද්‍රයා** වූ ශ්‍රී වික්‍රම **රාජසිංහ** නරේශ්වරයා කන්ද උඩරට ප්‍රදේශයේ අතිශය **රහසිගත** ගල්ගුහාවක සැඟව සිටියේ ය. ජාතිභ්‍රෂ්ට සිංහලයෙක් **රජතුමා** සැඟවී සිටින ස්ථානය ගැන ඔත්තුව ඉංග්‍රීසීන්ට ලබා දුන්නේ ය. ඔවුහු ශ්‍රී වික්‍රමයන් ජීවග්‍රහයෙන් අල්ලා ගත්හ.

මෙය ඇසූ බොහෝ ලාංකිකයෝ "අනේ! අපේ අවසාන **රාෂ්ට්‍රපතියා** සතුරන්ට හසු වූයේ ය"යි ශෝකාකුල වූහ. එහෙත් **රජුගේ** විරුද්ධවාදීහු ප්‍රීති-ප්‍රාමෝද්‍යයට පත් වූහ. ඉංග්‍රීසි ආණ්ඩුව රාජසිංහයන් **රටින්** පිටුවහල් කිරීමට තීරණය කළේ ය.

එදා රටින් පිට ව යාමට නැවට නැඟි මේ නර ශ්‍රේෂ්ඨයා පරාජිත වූයේ නමුදු පෙනුමින් තේජවන්ත ය; ඥානවන්ත ය; ධෛර්යවන්ත ය. නැවට නැඟී තම මාතෘභූමිය දෙස බලා අතීතය ස්මරණය කළේ ය. තමාගේ දුර්වලතා මෙනෙහි කළේ ය. සතුරන්ගේ කුමන්ත්‍රණෝපායයන් සිහි කළේ ය. ඈතින් පෙනෙන ලංකා මාතාවගේ ශ්‍රී විභූතිය, රම්‍යත්වය සිතින් සිතුවේ ය; නෙතින් උරා බීවේ ය; මුවින් මිමිණී ය.

"ඉතින් ආයුබෝවන් ලක් මවුනි ගරු"

යනුවෙන් කියා සමුගෙන, මේ පෙරදිග මුතු ඇටය තිතක් ව වියැකී යන තෙක් ම දෘෂ්ටිපථයෙන් ඉවත් නො කළේ ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පටිපාටියෙන් ලියන්න.

(ii) මෙහි අන්තර්ගත ස්වරාදේශ සන්ධි පද **තුනක්** විසන්ධි කර දක්වන්න.

(iii) අස්ත්‍යර්ථයේ තද්ධිත පද **තුනක්** උපුටා දක්වන්න.

(iv) 'රාජේන්ද්‍රයා, රාෂ්ට්‍රපතියා, ප්‍රාමෝද්‍යයට' යන වචනවල ස්වර-ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

(v) ඕෂ්ඨජ අක්ෂර දෙකක්, රකාරාංශයක් සහ යංශයක් සහිත වචනයක් ඡේදයෙන් උපුටා ලියන්න.

(ලකුණු $03 \times 5 = 15$ යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) පරරූප සන්ධිය

(ii) ඌෂ්මාක්ෂර

(iii) අනාගත කාල ආඛ්‍යාතය

(iv) උපමාවාචී නිපාත

(v) 'තර, තම' තද්ධිත ප්‍රත්‍යය

(ලකුණු $05 \times 3 = 15$ යි.)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki